
# අළු කෑදැත්තා

## නිරීක්ෂණය



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# අළු කෑදැත්තා නිරීක්ෂණය




**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කෘතියේ නම : අළු කෑදෑත්තා නිරීක්ෂණය

ප්‍රථම මුද්‍රණය : 2025.02.08

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.ශ්‍රේණිය : 2 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-208-481-7

පරිගණක අක්ෂර, පිටු සැකසුම

: සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- කිටියාට පාඩමක්...
- මම ආසයි ඉගෙනගන්න...
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy
- බඩේ අමාරුව
- මට හරියට වැඩ
- කවුද හොරා?
- මම තනියෙන්
- හරි වැඩේ...

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "හෙරණගත්කරණී 2024" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 2 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් කළ නිරීක්ෂණයක්, ඡායාරූප හා චිත්‍ර ඇතුළත් පොතකි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්වදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"පෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තුතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත්, සහ

මල්ලීට


මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

# අළු කෑදැත්තා නිරීක්ෂණය


මේ පොතේ විස්තර කරන්නේ මගේ ගෙවත්තට එන කුරුල්ලෙක් වන අළු කෑදැත්තා ගැනයි.

ඌ ශ්‍රී ලංකාවට ආවේණික කුරුල්ලෙකි.


විද්‍යාත්මක නාමය - *Ocyceros gingalensis*




**ශරීර පැහැය** - අළු, සුදු පාටයි.




**විශාලත්වය/ ශරීර ප්‍රමණය** - සෙන්ටිමීටර 55 සිට 59 දක්වා වෙයි.



**පියපත්** - කෙටි රවුම් ඒවා ය.




**ජීවත්වන පරිසරය** - උඩරට කඳුකර බිම් සහ පහතරට වනන්තර වල ය.



**ආහාර** - ගෙඩි වර්ග හා කුඩා කටුස්සන්, ගෙම්බන් හා කුඩා කෘමීන් ආහාරයට ගනී. සමහර විට කුඩා කුරුල්ලන්ගේ බිත්තර හා කුඩා පියෑඹීමට නොහැකි පැටවුන් ද කෑමට ගනී.


**ගෙඩි වර්ග-** නුග, සාදික්කා, පිහිඹිය, කීන මාදං සහ පලතුරු වර්ග.




**ශබ්දය –**

ඌ... ඌ... ඌ...ඌ...කා...කා...කා..ක.කා...කා..කා..ක

වැනි හඬක් පිටකරයි.



**පැටවුන් බිහි කරන කාලය** - අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය.



| අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු |
|---|---|---|---|---|
| | | | | |

**කූඩුව/ කැදැල්ල** - ගසක කඳේ පහතින් තිබෙන බෙනයක කූඩුව සාදයි.



## මම ගෙවත්තේ දී  අළු කෑදැත්තා ගැන නිරීක්ෂණය කළ දේවල්

උං උදය කාලයේ සහ හවස් කාලයේ අපේ ගෙදර අසල පිහිඹිය හා ඇල්බීසියා ගස්වලට පැමිණෙයි.


සමහර විට කිහිප දෙනෙක් එක විට අසල ගස් කීපයකටම පැමිණෙයි.

උන් එකිනෙකාට ශබ්ද නඟයි.



පිහිඹිය ගෙඩි හා ඉඳුනු පැපොල් ගෙඩි කයි. මම එක දවසක සවස කුඩා කටුස්සකු අල්ලාගෙන සිටි අළු කෑදත්තෙකු දැක්කා. උගේ වසුරුවල උං කෑමට ගත් ගෙඩිවල ඇට වර්ග තිබෙනවා.

කුඩා ගෙඩි වර්ග කෑමට ගන්නා විට උං ඔලුවත් හොටත් උඩට හරවනවා.



මගේ ගෙවත්තට එන අනෙක් කුරුල්ලන්ට වඩා අළු කෑදැත්තා ලොකුයි. අළු කෑදැත්තා ගස් වලට එන විට දෙමලිච්චන් ඒ ගස්වලින් ඈතට යනවා. මයිනන් නම් ඌට බය නැහැ.

හොටේ ඇලවුනු ගෙඩිවල හා ඇට වල කැබලි ගස් වල හොට ඇතුල්ලා, ඌ උගේ හොට පිස දමා ගන්නවා. මම උගේ හඬට නම් කැමති නැහැ. ඒ වුණාත් උගේ හැසිරීම බලන්න මම හරි ම කැමතියි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

9 786242 084817